# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2299/10 - 2022 සැප්තැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2022.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/HAR/4/2/1/51.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමා. යොමු අංකය*: 4-3/09/2017/WS/589.

මහනුවර උතුර පාතදුම්බර ජල සම්පාදන ව්‍යාපෘතියේ යහලතැන්න සේවා ජලාශ්‍රයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ රුවන්පුර (460) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රුවන්පුර ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක 7145 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01, 02, 03, 04 ලෙස දැක්වෙන හෙක්ටයාර් 0.0150ක් පමණ වූ ඉඩම් කැබලි 04:

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0039

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0062

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0046

04. **කැබලි අංක 4**
ඉඩමේ නම: -; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0003

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.11.21 වැනි දින පෙ. ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022.11.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

මොහාන් ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0292




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2017/WS/146.
*මගේ අංකය* : KDS/UNU/4/6/LA/63/2016.

මා විසින් 2022 අප්‍රේල් මස 08 වැනි දින අංක 2274/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 දෙසැම්බර් මස 05 වැනි දින පෙ. ව. 10.30ට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022.11.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
උඩුනුවර.

EOG 09 - 0293

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/394.
*මගේ අංකය* : KDS/UNU/4/6/LA/62/2014.

මා විසින් 2022 අප්‍රේල් මස 08 වැනි දින අංක 2274/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 දෙසැම්බර් මස 05 වැනි දින පෙ. ව. 10.00ට උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022.11.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුයි.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
උඩුනුවර.

EOG 09 - 0294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.